**Psychological Academic Books written by Dr. Kalyani Ruwanpathirana (Ph.D)**

Research Publications ( Book of Abstracts – Sinhala & English Version)

| Title | Date | Abstract (minimum 300 words) | Published Source (Path of link) |
|---|---|---|---|
| බෞද්ධායුර්වේද උපදේශන මනෝකායික චිකිත්සා න්‍යායාත්මක ප්‍රවේශය<br><br>ISBN – 978-955-42659-0-5 | 2015 | බෞද්ධායුර්වේද උපදේශන මනෝකායික චිකිත්සා න්‍යායාත්මක ප්‍රවේශය යන මෙම කෘතිය මාගේ ආචාර්ය උපාධිය ලැබීමෙන් පසුව ලියන පලමු ශාස්ත්‍රීය ග්‍රන්ථයයි. මෙය අවු 19ක මාගේ වෛද්‍ය වෘත්තියේ මනෝ රෝග සායන තුළ ක්‍රියාත්මක කළ ප්‍රායෝගික චිකිත්සා අංශයේ ප්‍රතිඵලයකි. දිගුකාලීනව මවිසින් යොදාගත් අත්හදා භාවිතා කළ හා අධ්‍යයනයට ලක් කළ බෞද්ධායුර්වේද ක්‍රමවේද සම්පිණ්ඩනය කර එම ක්‍රමවේද වල අන්තර්ගත න්‍යායන් හඳුන්වා දීම මෙහි මුඛ්‍ය පරමාර්ථය වේ<br><br>එම න්‍යායන් රෝග නිවාරණ උපදේශන ප්‍රවේශයන් ලෙස ඉතා සාර්ථකව යොදාගත හැක. නූතන සමාජය තුළ මිනිසා උග්‍ර මානසික පීඩනයකට ලක් වී ඇත. මුදල් පසුපස හඹායන නවීකරණය වූ කාර්යබහුල ලෝකයේ පුද්ගල අවශ්‍යතා සංකීර්ණ වී ඇත. අතීතයේ තිබූ සරල අල්පේච්ඡ ජීවිතය පුද්ගලයාට අහිමි කර දමා ඇත. මානසික පීඩනයේ ප්‍රතිඵලයක් ලෙස මනෝ මූලික රෝගාබාධ හා බෝ නොවන රෝග සීඝ්‍ර ලෙස වර්ධනය වී ඇත.එම රෝගාබාධ සඳහා අතුරු ආබාධ රහිත චිකිත්සා ප්‍රවේශ මෙහි විස්තර කර ඇත.<br><br>නොවිසඳුන මානසික ගැටළු සමග බොහෝ දෙනා පීඩාවට ලක්ව ජීවත් වෙති. මනෝ මූලික රෝගාබාධවල රෝග බීජය දිගුකාලීනව සිත තුල පවතින මානසික පීඩනය හා පීඩාකාරී මතකයන් වේ. මනෝ මූලික රෝගාබාධ හා බුදු සමය අතර සමීප සබඳතාවයක් ඇත. අතීතයේ පුද්ගලයාගේ විෂම චර්යාව බෞද්ධ මනෝ ප්‍රතිකාර තුලින් සමනය කර ඇත. පටාචාරා, කිසාගෝතමී කථා පුවත් එයට කදිම මුලාශ්‍රයක් සපයනු ලැබේ.<br><br>පුද්ගලයා යහපත් ජීවන රටාවකට හුරුකරන ප්‍රතිපත්ති රාශියක් ආයුර්වේද මුලාශ්‍ය තුළ ඇත. එම ප්‍රවේශ හා බුදුදහමේ අන්තර්ගත චිකිත්සා ප්‍රවේශ සම්පිණ්ඩනය කර ඒවායේ | ඩිල් ප්‍රින්ටර්ස් |

| | | | |
|---|---|---|---|
| | | උපදේශනාත්මක පැතිකඩ මෙම කෘතිය මඟින් විවර කර ඇත. මෙම ප්‍රතිකාරාත්මක උපදේශන ප්‍රවේශ අනුගමනය කිරීමෙන් පුද්ගලයා විෂම චර්යාවෙන් මුදවා ගත හැක.<br>අන්තර්ගතය :<br>• පෙරවදන<br>• පරිච්ඡේද 01 - හැදින්වීම<br>• පරිච්ඡේද 02 - මනෝකායික රෝගාබාධ පිලිබද බෞද්ධ ආයුර්වේද හා බටහිර ආකල්පය<br>• පරිච්ඡේද 03 - බෞද්ධායුර්වේද උපදේශන මනෝකායික චිකිත්සා න්‍යායයන්<br>• පරිච්ඡේද 04 - බෞද්ධායුර්වේද උපදේශන මනෝ චිකිත්සා ක්‍රම<br>• පරිච්ඡේද 05 - බෞද්ධායුර්වේද උපදේශන ප්‍රවේශවල සාරාංශය<br>• පරිච්ඡේද 06 - බෞද්ධායුර්වේද ක්‍රමයේ විශේෂත්වය<br>• පරිච්ඡේද 07 - සමාලෝචනය<br>• ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය | |

| | | | |
|---|---|---|---|
| Theoretical Approach to Buddhist Ayurveda Counselling Psychogenic Treatment<br><br>**ISBN – 978-955-42659-0-5** | **2015** | “Theoretical Approach to Buddhist Ayurveda Counselling Psychogenic Treatment” is the first academic research work written after my Ph.D. This is a result of the treatment practised in my Psychogenic Clinics during the last 19 years of my medical experience. Having summarized the Buddhist Ayurveda methods adopted and tested by me for a long period of time and to introduce the theories contained in those methods is the prime objective of this book.<br>Those theories can be successfully applied as therapeutic counselling approaches. In the modern society, man has been caught up in an acute mental stress. Various personal needs of people living in a modernized world where they are in a hectic chase behind money have been very complex. Today people have been deprived of the simple and modest life style prevalent in the past. As a result of the mental stress, psychogenic disorders and non-communicable diseases have increased and spread fast. Treatment methods for those disorders which are completely free from side effects have been described and propounded in detail in this book.<br>Today many people have been suffering miserably from unsolved problems. The root cause of psychogenic disorders is the long term mental stress and oppressive and repressive memories and remembrances. There is a close relationship between psychogenic disorders and Buddhist doctrine. Abnormal behavior has been made normal behavior through Buddhist psychotherapy in the past. The stories of Patachara and Kisagothami bear ample testimony to this fact and provides good sources to this point of view. There are many practices in Ayurveda sources that direct and lead man towards a better life style. Having summarized the therapeutic approaches that are found in them and the approaches found | Deal Printers |

| | | | |
|---|---|---|---|
| | | in Buddhism, various counselling aspects of them have been manifested and expressed through this book. By strictly adhering to and following these therapeutic approaches, a person can be prevented from being an abnormal character.<br><br>Content<br><br>Preface<br><br>Chapter 01<br>Introduction<br><br>Chapter 02<br>The Buddhist Ayurveda attitude and western attitude on psychogenic disorders.<br><br>Chapter 03<br>Theories of Buddhist Ayurveda Counselling Psychogenic Treatment.<br><br>Chapter 04<br>Buddhist Ayurveda Counselling Psychogenic Treatment methods.<br><br>Chapter 05<br>Summary of Buddhist Ayurveda Counselling Approaches.<br><br>Chapter 06<br>The Specialty of Buddhist Ayurveda methods.<br><br>Chapter 07<br>Review<br><br>Bibliography | |

| |
|---|
| **Research Profile links** |

| | |
|---|---|
| **Google Scholar** | |
| **LinkedIn** | |
| **Research Gate** | |